ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

නිකුත් කළේ: සංඛ්‍යාන දෙපාර්තමේන්තුව
දිනය: 2017-01-03

## ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය - 2015

සමස්ත රටෙහි සහ එහි පළාත්වල සෞභාග්‍ය තත්ත්වය මැනීම සහ සැසඳීම සිදු කරනු ලබන බහුමාන දර්ශකයක් වන ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය[1] පෙර වසරේ වාර්තා කළ 0.804 ක අගයේ සිට, 2015 වසරේ දී 0.864 දක්වා ඉහළ යන ලදී. මෙම වැඩි දියුණුවීම සඳහා ආර්ථික සහ ව්‍යාපාරික පරිසරය සහ ජන ජීවිතයේ යහ පැවැත්ම මනිනු ලබන උපදර්ශකවල ඉහළ යාම බලපා ඇති අතර සමාජ - ආර්ථික යටිතල පහසුකම් උපදර්ශකයෙහි මධ්‍යස්ථ හැසිරීමක් පෙන්නුම් කෙරිණි.


**සංඛ්‍යා සටහන 1 - ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය සහ උපදර්ශක 2014 – 2015**

| වර්ෂය | ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය | ආර්ථික සහ ව්‍යාපාරික පරිසරය උපදර්ශකය | ජන ජීවිතයේ යහ පැවැත්ම උපදර්ශකය | සමාජ - ආර්ථික යටිතල පහසුකම් උපදර්ශකය |
|---|---|---|---|---|
| **2014** | 0.804 | 1.012 | 0.611 | 0.788 |
| **2015** | 0.864 | 1.022 | 0.783 | 0.786 |

[1] ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය, ආර්ථික සහ ව්‍යාපාරික පරිසරය, ජන ජීවිතයේ යහ පැවැත්ම සහ සමාජ - ආර්ථික යටිතලපහසුකම් යන උපදර්ශක තුනකින් සමන්විත වන අතර ඒවා පළාත්බද ආර්ථික සහ සාමාජීය සංවර්ධනය පිළිබිඹු කරනු ලබන නියෝජනාත්මක විචල්‍යයන් 42 ක් භාවිතයෙන් මනිනු ලැබේ.

ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය, අවිධිමත් අංශයේ වැටුප්, කර්මාන්තශාලා ඝනත්වය සහ බැංකු ශාඛා ඝනත්වය යනාදියෙහි වැඩි වීම ආර්ථික සහ ව්‍යාපාරික පරිසරය උපදර්ශකයේ ඉහළ යාමට දායක විය. ජන ජීවිතයේ යහ පැවැත්ම උපදර්ශකය සැලකීමේ දී, එහි වැඩි දියුණු වීම ප්‍රධාන වශයෙන් සෞඛ්‍ය පහසුකම්, අධ්‍යාපනයේ ගුණාත්මකභාවය හා එය ලබාගැනීමට ඇති හැකියාව, මහජනතාවගේ ධනය සහ විනෝදය සඳහා වූ පහසුකම් පැවතීම හා භාවිතය යනාදියෙහි වැඩිවීම හේතුවෙන් සිදු විය. සමාජ ආර්ථික යටිතල පහසුකම් උපදර්ශකයේ මධ්‍යස්ථ හැසිරීම කෙරෙහි සමස්තයක් ලෙස මහා මාර්ග සංවර්ධනය උදෙසා වූ රාජ්‍ය වියදම් අඩු වීම සහ ප්‍රවාහන පහසුකම් සඳහා වූ ප්‍රවේශය පහත වැටීම හේතු විය. කෙසේ නමුත්, 2014-2015 කාලපරිච්ඡේදය තුළ දී සමාජ ආර්ථික යටිතල පහසුකම් උපදර්ශකය තුළ විදුලිය සඳහා වූ ප්‍රවේශය, විදුලි සංදේශ පහසුකම් ලබා ගැනීමට ඇති හැකියාව සහ ශ්‍රී ලංකාවේ අපරාධවලින් තොර පරිසරයක් පැවතීම යන පැතිකඩවල යම් පමණක දියුණුවක් දක්නට ලැබිණ.

**රූප සටහන 1 - ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය සහ උපදර්ශක[2] 2011 – 2015**





ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය සහ එහි උපදර්ශකයන් පසුගිය වසර පහ තුළ දී ඉහළයාමේ ප්‍රවණතාවයක් පිළිබිඹු කර ඇත. ජන ජීවිතයේ යහ පැවැත්ම උපදර්ශකය ඒකාකාරීව වැඩි වීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කර ඇති අතර ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය සහ අනෙකුත් උපදර්ශක දෙකෙහි ඉහළ යාමේ ප්‍රවණතාවයෙහි යම් මන්දගාමී වීමේ ස්වභාවයක් මෑත වසර කිහිපය තුළ දක්නට ඇත. 2014 - 2015 කාලපරිච්ඡේදය තුළ දී, ආර්ථික සහ ව්‍යාපාරික පරිසරය උපදර්ශකය සහ සමාජ - ආර්ථික යටිතල පහසුකම් උපදර්ශකයන්හි ඉහළ යාමට වඩා වැඩි වේගයකින් ජන ජීවිතයේ යහ පැවැත්ම උපදර්ශකය වැඩි දියුණු වී ඇත.

[2] ලෙගටම් සෞභාග්‍ය දර්ශකය (Legatum Prosperity Index) ගණනය කිරීමේ ක්‍රමවේදය සමීපව අනුගමනය කරමින්, අදාළ විචල්‍යයන් සම්මතකරණයෙන් දර්ශක අගයන් සම්පාදනය කෙරේ. එම නිසා දර්ශක අගයේ සලකුණ මගින් අදාළ මධ්‍යන්‍යයට සාපේක්ෂව එහි ධන හෝ ඍණ වෙනස්වීම පිළිබිඹු කරන අතර දර්ශකයේ ඍණ අගයන් මගින් සෞභාග්‍ය තත්ත්වය ඍණ මට්ටමක පවතීයැයි පිළිබිඹු නොවේ.

## පළාත්බද සෞභාග්‍යය

සෞභාග්‍ය පිළිබඳ වූ මෑතකාලීන ප්‍රවණතාවයන් අඛණ්ඩව පවත්වා ගනිමින් සමස්ත පළාත්බද දර්ශකය තුළ බස්නාහිර පළාත 1.275 ක ඉහළම දර්ශක අගය සමග මෙවරත් ප්‍රථම ස්ථානය ලබා ඇති අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් ආර්ථික සහ ව්‍යාපාරික පරිසරය උපදර්ශකය ඉහළ අගයක පැවතීම හේතු විය. 2015 වසරේ දී දකුණු පළාත, පළාත්බද සෞභාග්‍ය දර්ශකය තුළ දෙවන ස්ථානය පවත්වා ගැනීමට සමත් වූ අතර, ජන ජීවිතයේ යහපැවැත්ම උපදර්ශකය ඒ සඳහා ප්‍රධාන දායකත්වයක් දක්වා ඇත. උතුරු මැද පළාතේ ශ්‍රේණිය ස්ථාන තුනකින් ඉදිරියට ඒම 2015 වසරේ දී කැපී පෙනෙන කරුණක් වූ අතර උපදර්ශක තුනම ඉහළ යාම මේ සඳහා හේතු විය. පළාත්බද ශ්‍රේණිගත කිරීම් තුළ පිළිවෙළින් හතරවන, පස්වන සහ හයවන ස්ථානයන් ලබා ඇති මධ්‍යම, වයඹ සහ උතුරු පළාත්වල ශ්‍රේණි එක් ස්ථානයකින් වෙනස්වීම කෙරෙහි අනෙකුත් පළාත්වලට සාපේක්ෂව උපදර්ශකයන්ගේ ක්‍රියාකාරිත්වය මන්දගාමී වීම හේතු විය. සබරගමුව, ඌව සහ නැගෙනහිර පළාත්වල දර්ශක අගයයන් වැඩි වුවද, එය 2015 වසරේ දී සාපේක්ෂ ශ්‍රේණිගත තත්ත්වයන් වෙනස්කිරීමට හේතු නොවුණි. පළාත් ක්‍රියාකාරිත්වයන් රූප සටහන 2 සහ සංඛ්‍යා සටහන 2 මගින් විස්තර කෙරේ.

**රූප සටහන 2 - සෞභාග්‍ය දර්ශකය 2014 - 2015**





## ආර්ථික සහ ව්‍යාපාරික පරිසරය උපදර්ශකය

පළාත් පිළිබඳ ආර්ථික සහ ව්‍යාපාරික පරිසරය උපදර්ශකයේ වෙනස්වීම් විශ්ලේෂණය කිරීමේ දී, බස්නාහිර පළාත එහි ඉහළම ස්ථානය පවත්වාගත් අතර දෙවන සහ තෙවන ස්ථානයන් පිළිවෙළින් මධ්‍යම සහ වයඹ පළාත් විසින් හිමිකර ගැනුණි. ජීවන තත්ත්වය, දරිද්‍රතා මට්ටම පහළ යාම, මිල ස්ථායීතාවය, විධිමත් අංශයේ සේවා නියුක්තිය සහ කර්මාන්ත ශාලා ඝනත්වය යනාදිය තුළ නිරීක්ෂණය කළ හැකි වූ ඉහළ තත්ත්වයන් බස්නාහිර පළාතේ ඉහළ ක්‍රියාකාරිත්වය සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. පළාත්බද ශ්‍රේණිගත කිරීම්හි අනෙකුත් පළාත් තම ස්ථාන නොවෙනස්ව පැවතීම හෝ ඉහළ නංවා ගැනීම දක්නට ලැබුණු අතර, 2015 වසරේ දී උතුරු පළාතේ පමණක් ශ්‍රේණිගත කිරීම ස්ථාන තුනකින්

වෙනස් විය. මේ සඳහා ජීවන තත්ත්වය, දරිද්‍රතා මට්ටම පහළ යාම සහ කර්මාන්තශාලා ඝනත්වය යන අංශවල අඩු ක්‍රියාකාරිත්වය හේතු විය. ආර්ථික සහ ව්‍යාපාරික පරිසරය උපදර්ශකය තුළ පළාත් ක්‍රියාකාරිත්වයන් රූප සටහන 02 සහ 03 මගින් විස්තර කෙරේ.


**රූප සටහන 3 – ආර්ථික සහ ව්‍යාපාරික පරිසරය උපදර්ශකය 2014 - 2015**




## ජන ජීවිතයේ යහ පැවැත්ම උපදර්ශකය

ජන ජීවිතයේ යහ පැවැත්ම උපදර්ශකය තුළ බස්නාහිර පළාත ප්‍රමුඛ ස්ථානය පවත්වා ගත් අතර දකුණු පළාත තම දෙවන ස්ථානය සුරක්ෂිත කර ගැනීමට සමත් වී තිබේ. බස්නාහිර පළාත් දර්ශකය අනෙකුත් පළාත්වලට සාපේක්ෂව ඉහළ අගයක් පෙන්වූ අතර, අධ්‍යාපන පහසුකම් ලබා ගැනීමට ඇති හැකියාව, තිබෙන අධ්‍යාපන පහසුකම්වල ගුණාත්මකභාවය, ධනය සහ විනෝද කටයුතු සඳහා වූ පහසුකම් පැවතීම හා භාවිතය යන පැතිකඩවල වැඩි දියුණු වීමෙහි ධනාත්මක බලපෑම මේ සඳහා හේතු විය. උතුරු පළාත හැර අනෙකුත් සියලු පළාත්හි දර්ශක අගය ඉහළ ගිය ද එහි ශ්‍රේණිගත කිරීම් සැලකිය යුතු ලෙස වෙනස් නොවුණි. ජන ජීවිතයේ යහ පැවැත්ම උපදර්ශකය තුළ උතුරු පළාතේ ක්‍රියාකාරිත්වය 2015 වසරේ දී මන්දගාමී වූ අතර අධ්‍යාපන පහසුකම් ලබා ගැනීමට ඇති හැකියාව, ධනය සහ විනෝද කටයුතු සඳහා වූ පහසුකම් පැවතීම හා  භාවිතය අනෙකුත් පළාත්වලට සාපේක්ෂව අඩුවීම මේ සඳහා හේතු විය. ජන ජීවිතයේ යහ පැවැත්ම උපදර්ශකය තුළ පළාත් ක්‍රියාකාරිත්වය රූප සටහන 04 සහ සංඛ්‍යා සටහන 02 මගින් විස්තර කෙරේ.


**රූප සටහන 4 - ජන ජීවිතයේ යහ පැවැත්ම උපදර්ශකය 2014 – 2015**




## සමාජ - ආර්ථික යටිතල පහසුකම් උපදර්ශකය

සමාජ - ආර්ථික යටිතල පහසුකම් උපදර්ශකය තුළ බස්නාහිර පළාත අනෙකුත් පළාත්වලට සාපේක්ෂව ඉහළම දායකත්වය සපයා ඇත. විදුලිය, විදුලි සංදේශ පහසුකම්, මහා මාර්ග, ප්‍රවාහන පහසුකම් සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ පහසුකම් ඉහළ මට්ටමක පැවතීම, බස්නාහිර පළාතේ ඉහළ ක්‍රියාකාරිත්වයට හේතු විය. දකුණු සහ ඌව පළාත්හි සැලකිය යුතු වැඩි දියුණු වීමක් දක්නට ලද අතර, මෙම උපදර්ශකය තුළ මධ්‍යම සහ වයඹ පළාත්හි තත්ත්වයන් පහත වැටී තිබුණි. නැගෙනහිර පළාතේ උපදර්ශක අගය, සාපේක්ෂව අඩු මට්ටමක පැවති විදුලිය, විදුලි සංදේශ, ප්‍රවාහන සහ සනීපාරක්ෂක පහසුකම් හේතුවෙන් තරමක් පහළ ගොස් තිබුණි. සමාජ ආර්ථික යටිතල පහසුකම් උපදර්ශකය තුළ පළාත් ක්‍රියාකාරිත්වයන් රූප සටහන 5 සහ සංඛ්‍යා සටහන 2 මගින් නිරූපණය කෙරේ.

**රූප සටහන 5 - සමාජ - ආර්ථික යටිතල පහසුකම් උපදර්ශකය 2014 - 2015**



සංඛ්‍යා සටහන 2 - පළාත් මට්ටමින් සමස්ත සෞඛ්‍යාගාය දර්ශක, උපදර්ශක සහ පළාත්බද ශ්‍රේණි

| දර්ශකය සහ පළාත | දර්ශක අගය | | පළාත්බද ශ්‍රේණිය | |
|---|---|---|---|---|
| | 2014 | 2015 | 2014 | 2015 |
| **සමස්ත සෞඛ්‍යාගය දර්ශකය** | | | | |
| මධ්‍යම | 0.438 | 0.420 | 3 | 4 |
| නැගෙනහිර | 0.079 | 0.095 | 9 | 9 |
| උතුරුමැද | 0.364 | 0.458 | 6 | 3 |
| වයඹ | 0.430 | 0.370 | 4 | 5 |
| උතුරු | 0.366 | 0.308 | 5 | 6 |
| සබරගමුව | 0.223 | 0.298 | 7 | 7 |
| දකුණු | 0.440 | 0.550 | 2 | 2 |
| ඌව | 0.167 | 0.240 | 8 | 8 |
| බස්නාහිර | 1.327 | 1.275 | 1 | 1 |
| **ආර්ථික සහ ව්‍යාපාරික පරිසරය උපදර්ශකය** | | | | |
| මධ්‍යම | 0.638 | 0.572 | 2 | 2 |
| නැගෙනහිර | 0.295 | 0.318 | 7 | 7 |
| උතුරුමැද | 0.470 | 0.531 | 5 | 4 |
| වයඹ | 0.550 | 0.535 | 4 | 3 |
| උතුරු | 0.591 | 0.466 | 3 | 6 |
| සබරගමුව | 0.280 | 0.289 | 8 | 8 |
| දකුණු | 0.394 | 0.496 | 6 | 5 |
| ඌව | 0.198 | 0.183 | 9 | 9 |
| බස්නාහිර | 1.901 | 1.761 | 1 | 1 |
| **ජන ජීවිතයේ යහ පැවැත්ම උපදර්ශකය** | | | | |
| මධ්‍යම | 0.122 | 0.275 | 6 | 5 |
| නැගෙනහිර | -0.059 | -0.011 | 9 | 9 |
| උතුරුමැද | 0.214 | 0.357 | 5 | 4 |
| වයඹ | 0.344 | 0.387 | 4 | 3 |
| උතුරු | 0.381 | 0.272 | 3 | 6 |
| සබරගමුව | 0.079 | 0.249 | 7 | 7 |
| දකුණු | 0.635 | 0.703 | 2 | 2 |
| ඌව | -0.033 | 0.085 | 8 | 8 |
| බස්නාහිර | 1.039 | 1.210 | 1 | 1 |
| **සමාජ - ආර්ථික යටිතල පහසුකම් උපදර්ශකය** | | | | |
| මධ්‍යම | 0.555 | 0.414 | 2 | 5 |
| නැගෙනහිර | 0.000 | -0.023 | 9 | 9 |
| උතුරුමැද | 0.408 | 0.486 | 3 | 2 |
| වයඹ | 0.397 | 0.187 | 4 | 7 |
| උතුරු | 0.127 | 0.187 | 8 | 8 |
| සබරගමුව | 0.310 | 0.356 | 6 | 6 |
| දකුණු | 0.290 | 0.450 | 7 | 4 |
| ඌව | 0.336 | 0.450 | 5 | 3 |
| බස්නාහිර | 1.041 | 0.855 | 1 | 1 |

## තාක්ෂණික සටහන:

**දර්ශකය**

ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය ශ්‍රී ලංකා මහ බැංකුව මගින් සම්පාදනය කරනු ලබන බහුමාන දර්ශකයක් වේ. විචල්‍යයන් 42 කින් සමන්විත මෙම දර්ශකය සැකසීමේ දී ආර්ථික හා ව්‍යාපාරික පරිසරය, ජන ජීවිතයේ යහ පැවැත්ම, සමාජ - ආර්ථික යටිතල පහසුකම් යන උපදර්ශක තුන උපයෝගී කර ගැනේ. ප්‍රධාන දර්ශකය තුළ සියලුම උපදර්ශක සඳහා සමාන බර තැබීම් ද, උපදර්ශක තුළ ඊට අදාළ සෑම විචල්‍යයක් සඳහා සමාන බර තැබීම් ද ලබා දී තිබේ.

ආර්ථික සහ ව්‍යාපාරික පරිසරය උපදර්ශකය ජීවන තත්ත්වය, සේවා නියුක්තිය, ආදායම, දරිද්‍රතාවය, මිල ස්ථායීතාව, ආංශික සේවා නියුක්තිය, කර්මාන්තශාලා ඝනත්වය සහ බැංකු ශාඛා ඝනත්වය ලෙස වර්ග කරනු ලැබූ විචල්‍යයන් 09 ක් භාවිතා කරමින් සම්පාදනය කරනු ලැබේ. ජන ජීවිතයේ යහ පැවැත්ම පිළිබඳ උපදර්ශකය ගණනය කිරීමේ දී, සෞඛ්‍ය පහසුකම් පැවතීම, අධ්‍යාපන පහසුකම් පැවතීම, පවතින අධ්‍යාපන පහසුකම්හි ගුණාත්මකභාවය, ධනය, විනෝද කටයුතු සඳහා වූ පහසුකම් පැවතීම හා එහි භාවිතය, වායුගෝලයේ ගුණාත්මකභාවය සහ පරිසරයේ පිරිසිදු බව යන අංශයන්ට අදාළව විචයයන් 22 ක් භාවිතා කරනු ලැබේ. සමාජ - ආර්ථික යටිතල පහසුකම් උපදර්ශකය විචල්‍යයන් 11 කින් සමන්විත වන අතර, එමගින් විදුලිය සඳහා වූ ප්‍රවේශය, විදුලි සන්දේශ පහසුකම්, මහා මාර්ග, අපරාධවලින් තොර පරිසරයක් පැවතීම, ප්‍රවාහන පහසුකම්, ආරක්ෂිත පානීය ජල පහසුකම්, නල ජලයේ ගුණාත්මකභාවය, පරිගණක හා තොරතුරු තාක්ෂණ පහසුකම් සහ සනීපාරක්ෂක පහසුකම් යන පැතිකඩ ආවරණය වේ.

**ක්‍රමවේදය**

2014 වසරේ සිට ක්‍රියාත්මක වන නව ක්‍රමවේදය මගින් ලෙගටම් සෞභාග්‍ය දර්ශකය (Legatum Prosperity Index) ගණනය කිරීමේ ක්‍රමවේදය සමීපව අනුගමනය කරනු ලබන අතර ඒ අනුව, සියලුම විචල්‍යයන් එකකින් අනිකෙහි අනුපාතයක් ලෙස ගැනීම සඳහා දත්ත සාමාන්‍යකරණය වෙනුවට සම්මතකරණය කරනු ලබයි.